# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013**
**(නව නිර්දේශය)**
**2016 අගෝස්තු - ඔක්තෝබර්**
**සමාජීය විද්‍යා පීඨය**

**දේශපාලන විද්‍යාව - POLS - E 3025**
**රාජ්‍ය පරිපාලනය සහ විමධ්‍යගතකරණය**

**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. රාජ්‍ය පරිපාලනයේ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පරිපාලන විද්‍යාඥයන් අතර නිශ්චිත එකඟතාවයක් නොමැත. සාකච්ඡා කරන්න.

02. පරිපාලනය අධ්‍යයනය කිරීම සඳහා දායකත්වය දැක්වූ පහත සඳහන් **එක් අයෙකු** පිළිබඳව සාකච්ඡා කරන්න.

    i. වුඩ්රෝ විල්සන්

    ii. හෙන්රි ෆෙයෝල්

03. මැක්ස් වෙබර් විසින් ඉදිරිපත් කර ඇති නිලබල ක්‍රමයේ මූලික ලක්ෂණ මොනවාද? එය සමාජීය විද්‍යාඥයන්ගේ විවේචනයට බඳුන් වූයේ ඇයි?

04. විමධ්‍යගතකරණය යන්න පැහැදිලි කරමින් භාවිතයේ ඇති ආකෘති මොනවාද යන්න සාකච්ඡා කරන්න.

05. පහත දක්වා ඇති ඒවායින් **එකක්** පිළිබඳව කෙටි රචනයක් ලියන්න.

    i. ඇමරිකා එක්සත් ජනපදයේ පෙන්ඩෙල්ටන් පනත ( Pendleton Act)

    ii. සමස්ත ඉන්දීය සිවිල් සේවාව (All India Civil Services)

06. i. විධිමත් සහ අවිධිමත් සංවිධානය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පැහැදිලි කරන්න.

    ii. පරිපාලන සංවිධානයක් තුළ ක්‍රියාත්මක වන විධිමත් සහ අවිධිමත් සංවිධානවල සම්බන්ධතාව විස්තර කරන්න.

(අනෙක් පිට බලන්න)

07. බ්‍රිතාන්‍ය නූතන සිවිල් සේවාවේ වර්ධනයට පහත සඳහන් ඒවායින් **එකක්** දායක වී ඇති ආකාරය සාකච්ඡා කරන්න.

i. 1854 නෝර්ත් කෝට් ට්‍රැවලියන් ප්‍රතිසංස්කරණ (North Cote-Trevelyan Reforms)

ii. 1966 ෆුල්ටන් කොමිටි වාර්තාව (Fulton Committee Report)

08. පහත සඳහන් ඒවායින් **දෙකක්** පිළිබඳව සටහන් ලියන්න.

i. ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල සහ කාර්යයන්

ii. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 19 වන සංශෝධනය

iii. ශ්‍රී ලංකාවේ පළාත් සභාවල බලතල සහ කාර්යයන්

iv. ප්‍රංශයේ ප්‍රිෆෙක්ට් ක්‍රමය

**********************